**හලාවත නගර සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**------------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට හලාවත නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු හා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.3,952,220 ක් වූ යන්ත්‍ර හා උපකරණ රු.2,235,320 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු රු.145,650 ක් වූ ලී බඩු හා සවිකිරීම් ප්‍රාග්ධන ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු හා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.51,900 ක් වූ පුස්තකාල පොත් රු.33,985 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට උපලේඛනය අනුව තොග ශේෂය රු.6,368,520 ක් වුවද, එය රු.7,237,861 ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.20,313,549 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණය රු.16,731,416 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) පොලිය සමග ආපසු ලබාගෙන තිබුණු රු.6,991,699 ක් වූ ස්ථාවර තැන්පත් ආයෝජනයකින් රු.6,250,000 ක් පමණක් ආයෝජන ගිණුමට බැරකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන ගිණුම රු.741,699 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කල අගය මත බදු රු.378,245 ක් හා ජාතිය ගොඩනැගීමේ බදු රු.65,170 ක් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස පෙර ගෙවුම් යටතේ දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂ තුල පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.381,500 ක් වූ ඖෂධ තොගය ගිණුම්ගත කර නොතිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.8,425,943 ක් වූ මුළු මුදල වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබියදී ඊට අදාලව නැවත වරක් රු.306,182 ක් ණයහිමියෝ ලෙස දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

**---------------------**

ගිණුම් විෂයයන් 22 කට අදාලව ඉදිරිපත් කර තිබූ උපලේඛන / උපයෝගී පොත් අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර රු.68,086,679 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

**-----------------------------------**

(අ) ලැබියයුතු ගිණුම්

---------------------

2017 දෙසැම්බර් 31 දිනට රු.9,447,385 ක් වූ ලැබිය යුතු ශේෂ වලින් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

----------------------

2017 දෙසැම්බර් 31 දිනට රු.63,465,127 ක් වූ ගෙවිය යුතු ශේෂ අතර වර්ෂ 03 කට වැඩි කාලයක සිට ගෙවියයුතු ලෙස දැක්වෙන රු.13,944,828 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

**-------------------------------------------------------**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 200,337,534 ක්වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 නීතී, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**-----------------------------------------------------------------------------**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතී,රීති, රෙගුලාසි කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| ----------------------------- | ------------ | ------------------- |
| | රු. | |
| (අ) නගර සභා ආඥා පනත (255 අධිකාරය) | | |
| 153 වගන්තිය | - | ත්‍රිවිල් ගාස්තු සංශෝධනය කර අයකිරීම සඳහා රීති සම්පාදනය කරගෙන නොතිබුණි. |
| 170 වගන්තිය | 67,603,666 | වර්ෂ 01 කට වැඩි කාලයක සිට හිඟව ඇති වරිපනම් බදු හා හිඟ බදු කුලී සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| මු.රෙ. 571 | 1,644,574 | කල් ඉකුත් වු තැන්පත් ආදයමට ගැනීමට හෝ අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,382,877 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.21,969,182 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

**2.2.1 අක්‍රීය බැංකු ගිණුම්**

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඇති සභාවට අයත් අක්‍රීය ගිණුමක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.493,245 ක් විය.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනටමුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස් කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනටමුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 22,508,000 | 22,483,370 | 11,088,645 | 37,053,392 | 21,776,000 | 21,616,600 | 11,100,816 | 31,878,914 |
| (ii) | කුලී | 42,400,000 | 36,307,058 | 14,988,484 | 30,550,274 | 40,668,000 | 35,138,370 | 23,503,069 | 28,985,311 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,831,000 | 1,721,590 | 941,000 | 780,590 | 1,735,000 | 708,600 | 708,600 | 69,000 |
| (iv) | වෙනත් ආදායම් | 27,717,000 | 25,535,598 | 618,930 | 59,104,762 | 16,910,000 | 15,445,726 | 15,445,600 | 126 |

සටහන:- රැස් කල ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායමෙන් කළ එකතුකිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතුකිරීම් ඇතුලත්ව තිබේ.

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

---------------------------------------

වර්ෂයේ බිල්කළ ආදායමින් වරිපනම් හා බදු සහ කුලී ආදායම් පිළිවෙලින් සියයට 30 ක් සහ සියයට 39 ක් විය.

**2.3.3 වරිපනම් හා බදු**

-----------------

2017 ජනවාරි 01 දිනට අයවිය යුතු වරිපනම් හා බදු රු.31,878,914 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයට රු.22,483,370 ක් වූ බිල්කිරීම් සමග රු.11,088,645 ක් වර්ෂය තුල රැස්කරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුළු හිඟය රු.37,002,095 ක් වූයෙන් ආදායම් රැස්කිරීම සතුටුදායක මට්ටමක නොපැවතුණි.

**2.3.4 කුලී**

------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී හිඟ බදු කුලී හා කඩකුලීවල එකතුව රු. 28,985,311 ක් වූ අතර, වර්ෂයේ රු. 36,307,058 ක් වූ බිල්කිරීම් සමග සමාලෝචිත වර්ෂය තුල සියයට 33 කට සමාන රු. 14,988,484 ක් පමණක් රැස් කරගෙන තිබුණි.

(ආ) 2013 වර්ෂයේ තක්සේරුවක් මත කඩකුලී සංශෝධනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.12,653,923 ක කඩකුලී හිඟයක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

**2.3.5 මුද්දර ගාස්තු**

----------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.44,500,000 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

-----------------

නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විට කරුණු 24 වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

නගර සභා සීමාව තුලින් දිනකට එකතු කරනු ලබන කසළ ටොන් 12 ක් පමණ මුහුද හා කලපුව ආශ්‍රිත ප්‍රදේශයකට සහ වෙනත් විවෘත භූමියකට මුදා හැරීම සිදු කරනු ලබන තත්ත්වය තුල අනාගතයේදී පාරිසරික ගැටලු ඇතිවීමේ අවදානමක් පැවතුණි. මේ තත්ත්වය වලක්වා ගැනීම සඳහා දෛනිකව එකතු කරනු ලබන කසළ පරිසර හිතකාමී අයුරින් කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

----------------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව ලඟාකර ගත යුතු අරමුණු සහ ඉලක්ක කරා ලගාවීමේ මූලික පියවරයන් සභාව විසින් ආරම්භ කර තිබුණු අතර , එහිදී ජංගම සේවා පැවැත්වීම ,මානව සම්පත් කළමනාකරණය ,සේවක අභිප්‍රේරණය මෙන්ම මංමාවත් සංවර්ධනය ඇතුළු මහජන යටිතල පහසුකම් කෙරෙහි අවධානය යොමුකර තිබුණි. මෙම අරමුණු සම්බන්ධයෙන් විස්තර ක්‍රියාකාරී සැළැස්මේ ඇතුළත් කර තිබුණද, මානව හා භෞතික සම්පත් හඳුනාගෙන නොතිබුණු අතර ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් රු.51,180,000 ක් වූ ගිනි නිවන වාහනයක් ඉකුත් වර්ෂයේදී අනතුරකට භාජනය වී තිබුණු අතර, ඒ සඳහා මු.රෙ. 104(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මෙම වාහනය සඳහා පූර්ණ රක්ෂණයක් ලබා ගෙන නොතිබූ බැවින් අළුත්වැඩියාවට අදාල රු.879,500 ක් වූ සම්පූර්ණ මුදල නගර සභාවට දරා ගැනීමට සිදුවී තිබුණි.

(ආ) නගර සභා භූමියේ වර්ග අඩි 351 ක් වූ ගොඩනැගිල්ල තුල නගර සභා සේවකයෙක් විසින් 2017 වර්ෂයේ සිට ආපන ශාලාවක් පවත්වාගෙන යන අතර 2018 පෙබරවාරි වන විටත් ඒ සඳහා කිසිදු කුලියක් අයකරගෙන නොතිබුණි.

(ඇ) නගර සභාවේ නිලධාරීන් විසින් සකස් කරන ලද වාර්තාවකට අනුව බදු කරුවන් විසින් කඩකාමර 43 ක් අතුරු බදු දී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

**(අ)** අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

------------------------------------

2017 දෙසැම්බර් 31 දින සභාවේ ද්විතීයික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 56 ක්, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 15 ක් හා අතිරික්ත 02 ක්ද පැවතුණි.

(ආ) සේවක ණය

---------------

විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා මිය ගිය සේවකයින් 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.33,000 ක් වූ ණය ශේෂයක් වර්ෂ 03 කට වැඩි කාලයක සිට හිඟව පවතින අතර, අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

---------------------------------

විදුලි උපකරණ ඇනවුම්, ගබඩා ලැබීම්පත් හා මිලදීගත් ආයතනයෙන් ඉදිරිපත් කල බිල්පත් යනාදියේ සඳහන් විස්තර අවස්ථා ගණනාවකදී වෙනස් කර තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

------------------------------

**3.5.1 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩ සටහන - 2017 හා නගර සභා අරමුදල් මඟින් එකතුව රු.9,558,329ක වියදමින් ඉදිකර 2017 ජුලි 03 දින සභාව වෙත භාර දී තිබූ ආදාහනාගාරයේ ආදාහන කටයුතු 2018 මැයි 30 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**3.5.2 වාහන උපයෝජනය**

-------------------------

සභාව සතු වාහන 25 ක ඉන්ධන පරීක්ෂාවන් නියමිත කාල වකවානු අනුව සිදු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------------

**4.1 අභ්‍යන්තර විගණනය**

------------------------

අභ්‍යන්තර විගණන කටයුතු ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | ඉඩම් හා ගොඩනැගිලිවල පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කර ගැනීමට සමීක්ෂණයක් සිදුකර නොතිබීම. |
| (ආ) | ණයගැති පාලනය | පැරණි ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඈ) | ණයහිමි පාලනය | පැරණි ණයහිමි ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු නොකිරීම. |
| (ඇ) | ආදායම් පරිපාලනය | ආදායම් බිල් කිරීමේ සහ හිඟ ආදායම් අයකර ගැනීමේ ඌනතාවන් පැවතීම. |
| (ඉ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම සඳහා වූ ක්‍රියා මාර්ග ගෙන නොතිබීම. |